# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන)

**නිශ්චිත ප්‍රඥප්තිවල විධිවිධාන යටතේ සියලුම සිවිල් හෝ අපරාධ නඩු ඇසීම, විභාග කිරීම, තීරණය කිරීම සහ අවසන් කිරීම සඳහා කම්කරු විනිශ්චය අධිකාරවල සභාපතිවරයන්, අතිරේක මහෙස්ත්‍රාත්වරයන් ලෙස සැලකීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

---

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා විසින් 2022 අප්‍රේල් මස 08 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2022 මාර්තු මස 25 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[114 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 18.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන)

එල්.ඩී.—ඕ. 22/2020

**නිශ්චිත ප්‍රඥප්තිවල විධිවිධාන යටතේ සියලුම සිවිල් හෝ අපරාධ නඩු ඇසීම, විභාග කිරීම, තීරණය කිරීම සහ අවසන් කිරීම සඳහා කම්කරු විනිශ්චය අධිකාරවල සභාපතිවරයන්, අතිරේක මහෙස්ත්‍රාත්වරයන් ලෙස සැලකීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විශේෂ විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය

**1.** මේ පනත 2022 අංක    දරන කාර්මික ආරවුල් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින්, අධිකරණ විෂයය පැවරී ඇති අමාත්‍යවරයා විමසා ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නියම කරනු ලැබිය හැකි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා, අතිරේක මහෙස්ත්‍රාත්වරයකු ලෙස සලකනු ලබන බව

**2.** (1) යම් බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක් විසින් කරන ලද යම් ප්‍රදානයක් හෝ, (131 වන අධිකාරය වූ) කාර්මික ආරවුල් පනතේ විධිවිධාන යටතේ කම්කරු විනිශ්චය අධිකාරය විසින් කරන ලද ආඥාවක් හෝ කොමසාරිස්වරයාගේ යම් තීරණයක් බලාත්මක කිරීමේ හෝ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් මත ගෙවීම ආපසු අයකරගැනීමේ හෝ (මේ පනතේ "නිශ්චිත ප්‍රඥප්ති" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රඥප්තීන් හි විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා, කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයකුගේ බලතල සහ කාර්යන්ට අමතරව, (131 වන අධිකාරය වූ) කාර්මික ආරවුල් පනතේ 31අ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයකු, අතිරේක මහෙස්ත්‍රාත්වරයෙක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා, කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයකුගේ අධිකරණ බලය, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 5 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ වෙන් කරනු ලැබිය හැකි පරිදි, කම්කරු විනිශ්චය අධිකාරය පිහිටා ඇති මහෙස්ත්‍රාත් අධිකරණයක අධිකරණ බල ප්‍රදේශයට සීමා විය යුතු ය.

(3) මෙහි II වන උපලේඛනයේ I වන තීරයේ සඳහන් කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයාගේ අධිකරණ බලය, එම උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනෙහි සඳහන් කර ඇති මහේස්ත්‍රාත් අධිකරණයේ අධිකරණ බල ප්‍රදේශයට සීමා විය යුතු ය.

(4) සැක දුරුකිරීම සඳහා නිශ්චිත ප්‍රඥප්තීන් හි නිශ්චිතව දක්වා ඇති එම බලතල, II වන උපලේඛනයෙහි II වන තීරයේ නිශ්චිතව දක්වා ඇති අධිකරණ බල ප්‍රදේශ ඇතුළු මහේස්ත්‍රාත් අධිකරණයේ යම් අධිකරණ බල ප්‍රදේශයක, මහේස්ත්‍රාත් අධිකරණය විසින් දිගටම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සහ (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ විධිවිධාන අදාළ වීම

**3.** (1) කම්කරු විනිශ්චය අධිකාරයක සභාපතිවරයා, අතිරේක මහේස්ත්‍රාත්වරයකු ලෙස කටයුතු කරන අවස්ථාවක, යම් බේරුම්කරුවකු හෝ කාර්මික අධිකරණයක් විසින් කරන ලද යම් ප්‍රදානයක් හෝ (131 වන අධිකාරය වූ) කාර්මික ආරවුල් පනතේ විධිවිධාන යටතේ කම්කරු විනිශ්චය අධිකාරය විසින් කරන ලද නියෝගයක් හෝ කොමසාරිස්වරයාගේ යම් තීරණයක් බලාත්මක කිරීම හෝ කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබූ සහතිකයක් මත ගෙවීම ආපසු අයකර ගැනීම හෝ නිශ්චිත ප්‍රඥප්තීන් හි විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධාන ප්‍රකාරව ලඝු ලෙස විභාග කිරීම, නඩු විභාග කිරීම, තීරණය කිරීම, නඩු අවසන් කිරීම සඳහා බලය හා අධිකාරය එම සභාපතිවරයාට තිබිය යුතු ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ සහ (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, කම්කරු විනිශ්චය අධිකාරය ඉදිරියේ සිවිල් හෝ අපරාධ නඩු ඇසීම, නඩු විභාග කිරීම, තීරණය කිරීම සහ අවසන් කිරීම හා ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය:

එසේ වුව ද, (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ විධිවිධාන, කම්කරු විනිශ්චය අධිකාරය විසින් (131 වන අධිකාරය වූ) කාර්මික ආරවුල් පනතේ 31ආ වගන්තිය යටතේ නඩු කටයුතු පවත්වාගෙන යාම සඳහා අදාළ නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**4.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

I වන උපලේඛනය

[2(1) වන වගන්තිය]

1. 1981 අංක 72 දරන වැඩිලි කර්මාන්ත සේවකයන්ට දීමනා පනත
2. 1978 අංක 18 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව (අංක 2) පනත
3. 2005 අංක 36 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත
4. 2016 අංක 4 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව පනත
5. 1978 අංක 1 දරන සේවකයන්ගේ අයවැය සහන දීමනාව (අංක 1) පනත
6. (73 වන අධිකාරය වූ) රියදුරන් නියාමනය කිරීමේ ආඥාපනත
7. 1945 අංක 22 දරන කම්කරු පාලන (තනතුරු නාමය වෙනස් කිරීමේ) ආඥාපනත
8. (225 වන අධිකාරය වූ) රෝග (කම්කරුවන්ගේ) ආඥාපනත
9. 1979 අංක 32 දරන සේවක සභා පනත
10. 1959 අංක 6 දරන සේවක නිවාඩු පනත
11. 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත
12. 1975 අංක 6 දරන සේවක අර්ථසාධක අරමුදල් (විශේෂ විධිවිධාන) පනත
13. 1993 අංක 19 දරන සේවක භාරකාර අරමුදල් (විශේෂ විධිවිධාන) පනත
14. 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනත
15. 1978 අංක 8 දරන නවකයන් සේවයෙහි යෙදවීමේ (පුද්ගලික අංශය) පනත
16. 1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයෙහි යෙදවීම පිළිබඳ පනත
17. (133 වන අධිකාරය වූ) වතු කම්කරු (ඉන්දියානු) ආඥාපනත
18. 1971 අංක 2 දරන වතු නිවාස (විශේෂ විධිවිධාන) පනත
19. (128 වන අධිකාරය වූ) කර්මාන්තශාලා ආඥාපනත
20. 1978 අංක 11 දරන ඉන්ධන සංරක්ෂණ දින පහේ සති පනත
21. 1971 අංක 29 දරන නිවාඩු පනත
22. (132 වන අධිකාරය වූ) ඉන්දියානු සංක්‍රමණික කම්කරු ආඥාපනත
23. (131 වන අධිකාරය වූ) කාර්මික ආරවුල් ආඥාපනත
24. 1958 අංක 7 දරන කම්කරු පරීක්ෂක (තනතුරු නාමය වෙනස් කිරීමේ) පනත
25. 1968 අංක 40 දරන සේවකයන්ගේ අතුරු අවප්‍රමාණ දීමනා පනත

26. 1972 අංක 13 දරන කම්කරු සමීක්ෂණ (රහස්‍යභාවය පවත්වාගෙන යාමේ) පනත
27. (140 වන අධිකාරය වූ) සූතිකාගාර ආඥාපනත
28. (223 වන අධිකාරය වූ) වෛද්‍ය අවශ්‍යතා ආඥාපනත
29. (130 වන අධිකාරය වූ) පතල් (කාන්තා කම්කරුවන් භූගත කටයුතුවල නිරතවීම තහනම් කිරීමේ) ආඥාපනත
30. 1973 අංක 4 දරන පතල් හා ඛණිජ ද්‍රව්‍ය පනත
31. (210 වන අධිකාරය වූ) පතල්, ගල්වලවල් සහ ඛණිජ ද්‍රව්‍ය ආඥාපනත
32. 2021 අංක 28 දරන සේවකයන්ගේ අවම විශ්‍රාම යාමේ වයස පනත
33. (135 වන අධිකාරය වූ) අවම වේතන (ඉන්දියානු කම්කරු) ආඥාපනත
34. 1971 අංක 49 දරන ජාතික ආධුනිකත්ව පනත
35. 2016 අංක 3 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය පනත
36. 1978 අංක 34 දරන සියරට යවන ලද ඉන්දියානුවන්ට පාරිතෝෂික සහ වෙනත් මුල්‍ය වරප්‍රසාද ගෙවීම පිළිබඳ පනත
37. 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත
38. 1976 අංක 14 දරන වරප්‍රසාද නිවාඩු (පුද්ගලික) පනත
39. (137 වන අධිකාරය වූ) ගෘහස්ත සේවකයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත
40. (72 වන අධිකාරය වූ) සේවා ගිවිසුම් ආඥාපනත
41. (129 වන අධිකාරය වූ) සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත
42. 1978 අංක 17 දරන සේවකයන්ගේ විශේෂ දීමනා පනත
43. 1979 අංක 65 දරන සේවකයන්ගේ පරිපූරක දීමනා පනත
44. 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත
45. (138 වන අධිකාරය වූ) වෘත්තීය සමිති ආඥාපනත
46. 1970 අංක 25 දරන වෘත්තීය සමිති නියෝජිත (වතුවලට ප්‍රවේශ වීමේ) පනත
47. (134 වන අධිකාරය වූ) තුණ්ඩු තහනම් කිරීමේ ආඥාපනත
48. (136 වන අධිකාරය වූ) පඩිපාලක ආඥාපනත
49. (139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනත

II වන උපලේඛනය

[2(3) වන වගන්තිය]

| අනු අංකය | I වන තීරය<br>*කම්කරු විනිශ්චය අධිකාරය* | II වන තීරය<br>*අදාළ මහෙස්ත්‍රාත් අධිකරණ බල ප්‍රදේශය* |
|---|---|---|
| 1. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 1 | ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය, කොළඹ 12 |
| 2. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 2 | ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය, කොළඹ 12 |
| 3. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 8 | ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය, කොළඹ 12 |
| 4. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 13 | ප්‍රධාන මහෙස්ත්‍රාත් අධිකරණය, කොළඹ 12 |
| 5. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 33, මහරගම | මහෙස්ත්‍රාත් අධිකරණය, හෝමාගම |
| 6. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 32, රත්මලාන | මහෙස්ත්‍රාත් අධිකරණය, ගල්කිස්ස |
| 7. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 1/අතිරේකය සහ අංක 2/අතිරේකය,බත්තරමුල්ල | මහෙස්ත්‍රාත් අධිකරණය, කඩුවෙල |
| 8. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 30, කඩුවෙල | මහෙස්ත්‍රාත් අධිකරණය, කඩුවෙල |
| 9. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 19, අවිස්සාවේල්ල | මහෙස්ත්‍රාත් අධිකරණය, අවිස්සාවේල්ල |
| 10. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 24, ගම්පහ | මහෙස්ත්‍රාත් අධිකරණය, ගම්පහ |
| 11. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 31, වත්තල | මහෙස්ත්‍රාත් අධිකරණය, වත්තල |
| 12. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 21, මීගමුව සහ අංක 21/ අතිරේකය, මීගමුව | මහෙස්ත්‍රාත් අධිකරණය, මීගමුව |
| 13. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 25, පානදුර | මහෙස්ත්‍රාත් අධිකරණය, පානදුර |

| | | |
|---|---|---|
| 14. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 18, කළුතර | මහෙස්ත්‍රාත් අධිකරණය, කළුතර |
| 15. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 04, ගාල්ල | මහෙස්ත්‍රාත් අධිකරණය, ගාල්ල |
| 16. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 26, මාතර | මහෙස්ත්‍රාත් අධිකරණය, මාතර |
| 17. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 34, කොටපොල | මහෙස්ත්‍රාත් අධිකරණය, මොරවක |
| 18. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 03, මහනුවර | මහෙස්ත්‍රාත් අධිකරණය, මහනුවර |
| 19. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 39, පලාපත්වල | මහෙස්ත්‍රාත් අධිකරණය, මාතලේ |
| 20. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 38, නාවලපිටිය | මහෙස්ත්‍රාත් අධිකරණය, නාවලපිටිය |
| 21. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 37, තලවකැලේ | මහෙස්ත්‍රාත් අධිකරණය, තලවකැලේ |
| 22. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 10, හැටන් | මහෙස්ත්‍රාත් අධිකරණය, හැටන් |
| 23. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 09, නුවරඑළිය | මහෙස්ත්‍රාත් අධිකරණය, නුවරඑළිය |
| 24. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 05, බදුල්ල | මහෙස්ත්‍රාත් අධිකරණය, බදුල්ල |
| 25. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 36, බණ්ඩාරවෙල | මහෙස්ත්‍රාත් අධිකරණය, බණ්ඩාරවෙල |
| 26. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 44, අම්පාර | මහෙස්ත්‍රාත් අධිකරණය, අම්පාර |
| 27. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 06 (ර), රත්නපුර | මහෙස්ත්‍රාත් අධිකරණය, රත්නපුර |
| 28. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 40, බලංගොඩ | මහෙස්ත්‍රාත් අධිකරණය, බලංගොඩ |
| 29. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 06 (ඇ), ඇඹිලිපිටිය | මහෙස්ත්‍රාත් අධිකරණය, ඇඹිලිපිටිය |

| | | |
|---|---|---|
| 30. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 42, කෑගල්ල | මහෙස්ත්‍රාත් අධිකරණය, කෑගල්ල |
| 31. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 23, කුරුණෑගල | මහෙස්ත්‍රාත් අධිකරණය, කුරුණෑගල |
| 32. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 46, කුලියාපිටිය | මහෙස්ත්‍රාත් අධිකරණය, කුලියාපිටිය |
| 33. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 28, හලාවත | මහෙස්ත්‍රාත් අධිකරණය, හලාවත |
| 34. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 27, අනුරාධපුරය | මහෙස්ත්‍රාත් අධිකරණය, අනුරාධපුරය |
| 35. | කම්කරු විනිශ්චය අධිකාරය ත්‍රිකුණාමලය | මහෙස්ත්‍රාත් අධිකරණය, ත්‍රිකුණාමලය |
| 36. | කම්කරු විනිශ්චය අධිකාරය අංක 22, මඩකලපුව | මහෙස්ත්‍රාත් අධිකරණය, මඩකලපුව |
| 37. | කම්කරු විනිශ්චය අධිකාරය යාපනය | මහෙස්ත්‍රාත් අධිකරණය, යාපනය |